# සභාපතිවරයාගේ පණිවිඩය



**වෙනස් වෙමින් පවතින ව්‍යාපාරික පරිසරය තුළ, නව්‍යකරණය, විනයගරුක ක්‍රියාකාරීත්වය සහ පැහැදිලි උපායමාර්ගික අවධානය ඔස්සේ මතු වන නව අවස්ථා ග්‍රහණය කර ගැනීමට DIMO සමූහය මැනවින් සන්නද්ධව සිටියි.**

**සමූහයේ වර්ධනය උදෙසා වන ප්‍රධාන උපායමාර්ගික මෙවලම් වන විවිධාංගීකරණය, සුවිශේෂීකරණය සහ සහයෝගීතාවය බලගැන්වෙන්නේ අපගේ මානව සම්පත, තාක්ෂණය, තිරසාරත්වය සහ සන්නාම වටිනාකම මඟිනි. එබැවින්, එම ගාමක බලවේගයන් අඛණ්ඩව සපයනු ලබන සියලුම සම්පත් ඉතා සැලකිල්ලෙන් පෝෂණය කිරීමට අපි නිරන්තරයෙන් කැපවී සිටින්නෙමු.**

මූල්‍ය වර්ෂය පිළිබඳ සභාපතිතුමාගේ බහුභාෂා වීඩියෝ, ශ්‍රව්‍ය සහ PDF වාර්තාව සඳහා පිවිසෙන්න.

https://www.dimolanka.com/2025-2026-dimo-annual-report/url.php?id=5

### සංක්‍රාන්ති සමයක් සහ නව හැඩගැසීමක්

2026 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය දෙස ආපසු හැරී බලන විට, එය ශ්‍රී ලංකාවට මෙන්ම ගෝලීය ආර්ථිකයටම විශාල වෙනස්කම් මැද අලුත් මුහුණුවරකට හැඩගැසෙන තීරණාත්මක කාල පරිච්ඡේදයක් වූ බව පැහැදිලිය. දේශීය සාර්ව ආර්ථිකය ස්ථාවර වීමේ සාධනීය ලකුණු මතු වන්නට පටන් ගත්තද, ව්‍යාපාරික පරිසරය තුළ අවස්ථාවන් මෙන්ම බාධාවන් ද එකලෙස මිශ්‍රව පැවතුණි. කෙසේ වෙතත්, වසර පුරා පැවති උද්ධමන පීඩනය අඩු වීමත්, විදේශ විනිමය අනුපාත සාපේක්ෂව ස්ථාවර මට්ටමක පැවතීමත් හේතුවෙන්, රජයේ ප්‍රතිපත්තිමය දිශානතිය කුමක්දැයි කලින් පුරෝකථනය කරමින් වඩාත් සාර්ථක ව්‍යාපාරික තීරණ ගැනීමට මින් පහසු පසුබිමක් නිර්මාණය විය.

### භූදේශපාලනික වර්ධනයන්

ගෝලීය භූදේශපාලනික වර්ධනයන් ව්‍යාපාරික පරිසරය තවදුරටත් සංකීර්ණ කිරීමට හේතු විය. අඛණ්ඩව පවතින ගෝලීය වෙළඳ ගැටුම්, සැපයුම් දාමයන්හි සිදුවන නව වෙනස්කම් සහ භූදේශපාලනික අවිනිශ්චිතතාවය, ද්‍රව්‍යමය මිල ගණන්, සැපයුම් ක්‍රියාවලිය මෙන්ම ජාත්‍යන්තර මූලාශ්‍රකරණය කෙරෙහි ද බලපෑම් එල්ල කළේය. මෙය වෙළඳාම, සංචාරක ව්‍යාපාරය, විදේශ ප්‍රේෂණ සහ මූල්‍යකරණය සඳහා ශ්‍රී ලංකාව බෙහෙවින් රඳා පවතින ගෝලීය වෙළඳපොළෙහි විශ්වාසය පළුදු කිරීමට ද හේතු විය. ජාත්‍යන්තර ප්‍රධාන ව්‍යාපාරික හවුල්කරුවන් සහ ගෝලීය සැපයුම් ජාලයන් සමඟ සමීපව කටයුතු කරන DIMO සමූහයට ද මෙම තත්ත්වයන් අහිතකර ලෙස බලපෑවේය.

රටේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩසටහන අඛණ්ඩව සාධනීය ප්‍රතිඵල අත්කර දුන්න ද, ගෝලීය වෙළඳ ප්‍රතිපත්තිවල පවතින අවිනිශ්චිතතාවය සහ දැඩි භූදේශපාලනික නොසන්සුන්තාවය ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික හා සමාජයීය ස්ථාවරත්වයට තීරණාත්මක අවදානමක් එල්ල කරන බව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ද විශේෂයෙන් පෙන්වා දුන්නේය.

### නොසැලී ඉදිරියටම යාම

මෙවැනි පසුබිමක වුවද, DIMO සමාගම දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, සිය උපායමාර්ගික ප්‍රමුඛතාවන් නම්‍යශීලී සහ කඩිනම් ස්වභාවයකින් යුතුව අඛණ්ඩව ඉදිරියටම රැගෙන ගියේය. ක්ෂේත්‍ර හතක් පුරා විහිදුණු අපගේ විවිධාංගීකරණය වූ ව්‍යාපාරික ආකෘතිය, කෙටිකාලීන වෙළඳපොළ අස්ථාවරත්වයන්ට සාර්ථකව ඔරොත්තු දීමට ශක්තිමත් පදනමක් සැපයූ අතර, සමූහය තිරසාර වර්ධනයක් කරා මෙහෙයවීමට ද දායක විය. මෙම මූල්‍ය වර්ෂය ආරම්භ වීමට නියමිතව තිබියදී වාහන ආනයන සීමා ඉවත් කිරීමත් සමඟ, වසර පහකට පෙර පැවති

# සභාපතිවරයාගේ පණිවිඩය

තත්ත්වයට වඩා හාත්පසින්ම වෙනස් වූ නව ප්‍රවාහන ක්ෂේත්‍රයක් තුළ සුවිශේෂී ව්‍යාපාරික අවස්ථා නැවත උදා විය.

වඩාත්ම වැදගත් කරුණ නම්, අවිනිශ්චිත කාල පරිච්ඡේදයන්හිදී ව්‍යාපාරික විශ්වාසය තහවුරු කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය ආයතනික පාලනය, සදාචාරාත්මක හැසිරීම සහ පාර්ශවකරුවන්ගේ විශ්වාසය යන සාධක කෙරෙහි අපි ප්‍රමුඛතාවය ලබා දීමයි. අපගේ කණ්ඩායම විශිෂ්ට කැපවීමක් සහ අනුවර්තනය වීමේ හැකියාවක් ප්‍රදර්ශනය කළ අතර, ජාත්‍යන්තර ව්‍යාපාරික හවුල්කරුවන් සහ දේශීය පාර්ශවකරුවන් සමඟ පවතින දිගුකාලීන සබඳතා හේතුවෙන් බාධාවන් සාර්ථකව කළමනාකරණය කරමින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය අඛණ්ඩව පවත්වා ගැනීමට අපට හැකි විය.

## ගල්ෆ් කලාපීය යුද තත්ත්වය

සලකා බලනු ලබන වසර තුළ ගල්ෆ් කලාපයේ යුද තත්ත්වය උග්‍ර වීම, ශ්‍රී ලංකාවේ යථා තත්ත්වයට පත් වෙමින් පවතින ආර්ථිකයට තවත් බාහිර කම්පනයක් එක් කළ අතර, එය සියලුම ක්ෂේත්‍රවල ව්‍යාපාර කෙරෙහි සෘජු බලපෑමක් ඇති කළේය. මැදපෙරදිග වෙළඳපොළෙන් ආනයනය කරනු ලබන බලශක්ති ප්‍රභවයන් මත බෙහෙවින් යැපෙන රටක් ලෙස, ගෝලීය බොරතෙල් මිල ඉහළ යාම, නාවික මාර්ග අවහිර වීම සහ සැපයුම් මෙන්ම රක්ෂණ පිරිවැය ඉහළ යාම හේතුවෙන් ශ්‍රී ලංකාවට මෙම යුද වාතාවරණයේ අහිතකර බලපෑම්වලට මුහුණ දීමට සිදු විය.

## 'දිට්වා' සුළි කුණාටුව

සලකා බලනු ලබන වසර තුළ, පෙර නොවූ විරූ අර්බුද රැසකට මුහුණ දුන් අපගේ ආර්ථිකයට දිට්වා සුළි කුණාටුව තවත් බාධාවක් එක් කළේය. කෙසේ වෙතත්, අපගේ ව්‍යාපාරික හවුල්කරුවන් කිහිපදෙනෙකුගේ පරිශ්‍රයන්ට සිදු වූ භෞතික හානි හැරුණු විට, ඉන් DIMO සමාගමට එල්ල වූ සෘජු බලපෑම සාපේක්ෂව අවම මට්ටමක පැවතුණි. කිසිදු සැලකිය යුතු මූල්‍ය අලාභයක් සිදු නොවූ බැවින්, එම ස්වාභාවික විපතෙන් පසුව වහාම අපගේ ව්‍යාපාරික කටයුතු යථා තත්ත්වයට පත් කිරීමට අපට හැකි විය. එමෙන්ම විශ්වාසදායක ව්‍යාපාරික හවුල්කරුවෙකු ලෙස, වාණිජමය සීමාවන්ට යටත්ව විපතට පත්වූවන් වෙත සහන සැලසීමට ද DIMO සමාගම පියවර ගත්තේය.

## බාධක බිඳ දැමීම

සමූහය මෙම වසරේ දී උපයාගත් රුපියල් බිලියන 104ක පිරිවැටුම (2024/25 වසරේ රුපියල් බිලියන 50කි) සමාගම් ඉතිහාසයේ ප්‍රථම වතාවට රුපියල් බිලියන 100 සීමාව පසු කරමින් තැබූ සුවිශේෂී සන්ධිස්ථානයකි. මෙය පසුගිය වසරේ පිරිවැටුම සමඟ සැසඳීමේ දී 107%ක කැපී පෙනෙන වර්ධනයක් ද වේ.

## රථවාහන වෙළඳපොළ

කෙසේ වෙතත්, නැවත විවෘත වූ රථවාහන වෙළඳපොළ, වාහන ආනයන සීමා පැනවීමට පෙර පැවති වෙළඳපොළට වඩා හාත්පසින්ම වෙනස් විය. විශේෂයෙන්ම පාරිභෝගිකයින් තෝරාගනු ලබන වාහන මාදිලි සහ එම අවශ්‍යතාවන් සපුරාලන නිෂ්පාදකයින්/සැපයුම්කරුවන් සම්බන්ධයෙන් පැහැදිලි වෙනස්කම් දක්නට ලැබෙයි. මෙහිදී විද්‍යුත් වාහන සඳහා වන ඉල්ලුම කැපී පෙනෙන ලෙස ඉහළ ගොස් ඇති අතර, චීනයෙන් ආනයනය කරනු ලබන වාහන සඳහා ද එවැනිම ප්‍රවණතාවක් දක්නට ලැබුණි. වෙළඳපොළේ ඇති වෙමින් පවතින මෙම නව ප්‍රවණතාවන් සහ ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍යතා සපුරාලීමට DIMO සමූහය මැනවින් සූදානම්ව සිටියි.

## තාක්ෂණික දියුණුව

වත්මන් ලෝකය ඉතා වේගවත් තාක්ෂණික දියුණුවක් කරා ගමන් කරමින් සිටින අතර, නව තාක්ෂණයන් ඉතා කෙටි කාලයකින් යල් පැන යන තත්ත්වයකට පත්ව ඇත. මේ හේතුවෙන් සමාගම් කඩිනමින් ක්‍රියාත්මක නොවුවහොත් වෙළඳපොළෙන් ඉවත් වීමට සිදු වෙයි. නවීන තාක්ෂණයන් වැළඳ ගැනීමට ශක්තිමත් පදනමක් වන විස්තීර්ණ දත්ත පද්ධතියක් නිර්මාණය කිරීමේ පළමු පියවර ලෙස, අපි මොඩියුල රැසකින් සමන්විත 'SAP' ව්‍යවසාය මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කළෙමු. SAP පද්ධතිය සතු නම්‍යශීලීභාවය හේතුවෙන් අනෙකුත් ගැළපෙන තාක්ෂණයන් ද ඒකාබද්ධ කිරීමට අවස්ථාව ලැබෙන අතර, එය කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීනව නව තාක්ෂණයන් අනුගත කර ගැනීම සඳහා ශක්තිමත් පදනමක් ලෙස නිර්මාණය කර ඇත.

සලකා බලනු ලබන මූල්‍ය වර්ෂය තුළ තාක්ෂණය සහ ඩිජිටල් පරිවර්තනය DIMO සමූහයේ උපායමාර්ගික සැලසුම්වල කේන්ද්‍රස්ථානයක් ගත්තේය. මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට, පාරිභෝගික අත්දැකීම් දියුණු කිරීමට සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීම සක්‍රීය කිරීමට සමූහය විසින් ඩිජිටල් මෙවලම් සහ වේදිකාවන් භාවිත කිරීම වේගවත් කරන ලදී. ව්‍යවසාය පද්ධතීන්, ක්‍රියාවලි ස්වයංක්‍රීයකරණය සහ දත්ත විශ්ලේෂණ ක්ෂේත්‍ර සඳහා සිදු කළ ආයෝජන හේතුවෙන් සැපයුම් දාම විනිවිදභාවය, තොග කළමනාකරණය සහ සේවා සැපයුම ඉහළ නැංවීමට හැකි විය. එමෙන්ම ඩිජිටල් පාරිභෝගික සබඳතා වේදිකාවන් තවදුරටත් ශක්තිමත් කරන ලදී. මේ වන විට SAP ව්‍යවසාය පද්ධතියේ දෙවන අදියර ක්‍රියාත්මක වෙමින් පවතින අතර, එය නිම වීමෙන් පසු ව්‍යාපාරික නිරීක්ෂණ, විශ්ලේෂණ ධාරිතාවය සහ පාරිභෝගික අත්දැකීම් සැලකිය යුතු ලෙස වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ සමඟම, සමූහයක් ලෙස අපගේ නිෂ්පාදන සහ සේවාවන්හි තාක්ෂණික ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත්, ඒවා වඩාත් සාර්ථකව පාරිභෝගිකයා වෙත සමීප කිරීමටත් අපි බලාපොරොත්තු වෙමු.

## උපායමාර්ගය

සමූහයේ වර්ධනයේ ප්‍රධාන උපායමාර්ගික මෙවලම් වන විවිධාංගීකරණය, සුවිශේෂීකරණය සහ සහයෝගීතාවය බලගැන්වෙන්නේ අපගේ මානව සම්පත, තාක්ෂණය, තිරසාරත්වය සහ සන්නාම වටිනාකම මඟිනි. එබැවින්, එම ගාමක බලවේගයන් අඛණ්ඩව සපයනු ලබන සියලුම සම්පත් ඉතා සැලකිල්ලෙන් පෝෂණය කිරීමට අපි නිරන්තරයෙන් කැපවී සිටින්නෙමු. වාහන ආනයන සීමා පනවා තිබූ වකවානුවේ දී අපගේ විවිධාංගීකරණ උපායමාර්ගයේ වටිනාකම මැනවින් ඔප්පු වූ අතර, එමඟින් සමූහය වෙත විකල්ප ව්‍යාපාරික ක්ෂේත්‍රයන් විවෘත කර දෙමින් අපගේ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කළේය. ඉදිරියේදී තාක්ෂණය, පාරිභෝගික අත්දැකීම් සහ තිරසාරත්වය අපගේ සුවිශේෂීකරණ උපායමාර්ගයේ ප්‍රධාන ගාමක බලවේග වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## තිරසාරත්වය

තිරසාරත්වය වෙනුවෙන් ආයතනයක් ඉටු කළ යුතු කාර්යභාරයේ වැදගත්කම වෙන කවරදාටත් වඩා දැන් මැනවින් පැහැදිලි වී ඇත. අපගේ කොටස්කරුවන් උදෙසා වටිනාකම් නිර්මාණය කිරීමේ ප්‍රධාන මාවතක් ලෙස අපි තිරසාරත්වය හඳුනාගෙන ඇත්තෙමු. DIMO සමූහයේ 'තිරසාරත්ව උපායමාර්ගික සැලැස්ම 2030' මඟින්, තිරසාරත්වයට අදාළ අවදානම් සහ අවස්ථාවන් කළමනාකරණය කිරීමටත්, එම සංකල්පයන් අපගේ ව්‍යාපාරික ආකෘති තුළ ශක්තිමත්ව අන්තර්ගත කිරීමටත් අවශ්‍ය සමූහ උපායමාර්ගයන් මෙහෙයවනු ලබයි.

## අපගේ ආයතනික වත්කම්/ධනය

ආයතනයක් ලෙස, අප සැමවිටම අප සතු ආයතනික වත්කම් දෙස බලන්නේ පුළුල් දෘෂ්ටියකිනි. අප සතු මූල්‍ය හා නිෂ්පාදිත ප්‍රාග්ධනය වැනි මුදල්මය වත්කම් මෙන්ම, ව්‍යාපාරික සබඳතා, මානව සම්පත්, ස්වාභාවික සම්පත් සහ බුද්ධිමය ප්‍රාග්ධනය වැනි මුදල්මය නොවන වත්කම් ද අපි ඉතා ඉහළින් අගය කරන අතර ඒවා සැලකිල්ලෙන් පෝෂණය කරමු. ඒ අනුව, අප විසින් සකස් කරනු ලබන මෙම ඒකාබද්ධ වාර්තාව මඟින් වර්තමාන මෙන්ම අනාගත ආයෝජකයින්ට, අප සතු ආයතනික වත්කම්වල ස්වභාවය සහ කෙටිකාලීන, මධ්‍යකාලීන මෙන්ම දිගුකාලීනව කොටස්කරුවන් උදෙසා අගය නිර්මාණය කිරීමට එම වත්කම් සතු හැකියාව මැනවින් තක්සේරු කිරීමට අවස්ථාව සැලසේ.

## කොටස්හිමියන් වෙත මූල්‍ය ප්‍රතිලාභ

ආර්ථිකය තුළ පැවති සාපේක්ෂ ස්ථාවරත්වය සහ සුපුරුදු පරිදි අපගේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට මහපැදූ රථවාහන ආනයන සීමා ඉවත් කිරීම හේතුවෙන්, මෙම වසරේ දී එක් කොටසකට රුපියල් 172.37ක ඉපැයීමක් ළඟා කර ගැනීමට අපට හැකි විය. මෙය (පසුගිය 2024/25 වසරේ පැවති රුපියල් 137.00ක ඍණාත්මක එක් කොටසක අගය සමඟ සැසඳීමේදී) මෑත වසර කිහිපය තුළ අප අත්පත් කරගත් ඉහළම අගය වෙයි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

සලකා බලනු ලබන වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ වෙනස්කම් කිහිපයක් සිදු වූ අතර, ඒ හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල ද වෙනස්කම් සිදු විය. වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් විශ්‍රාම ගත් ඒ. ඩී. බී. තල්වත්ත මහතා, අධ්‍යක්ෂ මණ්ඩලය සහ එහි කමිටු වෙනුවෙන් ඉටු කළ මිල කළ නොහැකි සේවය අගය කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම, මෙම වසරේ දී අලුතින් අධ්‍යක්ෂ මණ්ඩලයට එක් වූ නව සාමාජිකයින් ද මම ඉතා උණුසුම් අයුරින් පිළිගනිමි.

සමාගම නිවැරදි දිශානතියකට මෙහෙයවීමේ දී, ඔවුන්ගේ වටිනා උපදෙස් හා මඟපෙන්වීම් අඛණ්ඩව ලබා දෙන අධ්‍යක්ෂ මණ්ඩලයක් හිමි වීමට තරම් මම සැමවිටම වාසනාවන්ත වීමි. මෙම වසරේ කැපී පෙනෙන මූල්‍ය ප්‍රතිඵල අත්කර ගැනීම සඳහා ලබා දුන් සුවිශේෂී දායකත්වය වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයින්ට මාගේ කෘතඥතාව පිරිනමමි.

## අපගේ ව්‍යාපාරික පවුල

වසර පහක් පුරා අපගේ ප්‍රධානතම ව්‍යාපාරික ක්ෂේත්‍රය වූ ප්‍රවාහන අංශය සීමා වී තිබූ දුෂ්කර කාල පරිච්ඡේදයේ දී, පෙරමුණ ගෙන ක්‍රියා කරමින් DIMO සමාගම අද පවතින මෙම සාර්ථක මට්ටමට ඔසවා තැබීමට කටයුතු කළේ අපගේ ව්‍යාපාරික පවුලේ සාමාජිකයින්ය. එම අසීරු වකවානුව තුළ DIMO සමාගමේ ඉදිරි දැක්ම වෙනස් කිරීමටත්, නව්‍යකරණයන් සිදු කිරීමටත් ඔවුහු සියලු දෙනාම එකමුතුව පෙළගැසුණහ. ඔවුන් ලබා දුන් සුවිශේෂී දායකත්වය වෙනුවෙන් සහ අපගේ සැලසුම් ද අභිබවා යමින් මෙවැනි විශිෂ්ට ප්‍රතිඵලයක් අත්කර දීම වෙනුවෙන් මම ඔවුන්ට මාගේ හෘදයාංගම කෘතඥතාව පිරිනමමි.

## අභියෝග

රථවාහන ආනයනය කිරීම, ගෙවුම් ශේෂය හරහා රටේ ආර්ථිකයට සැලකිය යුතු බලපෑමක් එල්ල කරන බව පොදුවේ පිළිගැනෙන කරුණකි. මේ හේතුවෙන්, වාහන ආනයන ධාරිතාවය පාලනය කිරීම සඳහා රජය විසින් නිරන්තරයෙන් බදු ගාස්තු සහ රෙගුලාසි සංශෝධනය කරනු ලබන අතර, එය සැමවිටම රජයේ දැඩි අවධානයට ලක්වන විෂයයක් බවට පත්ව ඇත. මෙම තත්ත්වය, මෙම ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ආසන්න අනාගතය සහ එහි වර්ධන විභවයන් පිළිබඳව නිරන්තර අවිනිශ්චිතතාවයක් ඇති කිරීමට හේතු වෙයි. කෙසේ වෙතත්, අපගේ විවිධාංගීකරණ උපායමාර්ගය මෙම අභියෝගය ජය ගැනීමට අපට බෙහෙවින් උපකාරී වූ අතර, අපගේ ප්‍රවාහන ව්‍යාපාරික ක්ෂේත්‍රයේ දියුණුව සහ නව්‍යකරණයන් උදෙසා කටයුතු කරන අතරම, රථවාහන නොවන සෙසු ව්‍යාපාරික අංශයන් තවදුරටත් ශක්තිමත් කිරීමට අපි අඛණ්ඩව පියවර ගන්නෙමු.

අප මුහුණ දෙන තවත් අභියෝගයක් වන්නේ, ගල්ෆ් කලාපීය යුද වාතාවරණය හේතුවෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට සහ සැපයුම් දාමයන්ට එල්ල විය හැකි අහිතකර අතුරු ප්‍රතිඵලයන්ය. මෙම බාධාකාරී තත්ත්වයන් තවදුරටත් පැවතුණහොත්, ඒවා සාර්ථකව ජය ගැනීම සඳහා අවශ්‍ය හදිසි ක්‍රියාකාරී සැලසුම් සමාගම සතුව දැනටමත් පවතියි.

## අනාගත දැක්ම

අප ඉදිරියටම ගමන් කිරීමේ දී, බාහිර අහිතකර බලපෑම් සහ භූදේශපාලනික අවිනිශ්චිතතාවයන් කෙරෙහි දැඩි අවධානයෙන් පසුවන අතරම, ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ ගමන් මඟ පිළිබඳව සාපේක්ෂ සුභවාදී අපේක්ෂාවන් තබා ගනිමු. මෙලෙස වෙනස් වෙමින් පවතින ව්‍යාපාරික වටපිටාව තුළ, නව්‍යකරණය, විනයගරුක ක්‍රියාකාරීත්වය සහ පැහැදිලි උපායමාර්ගික අවධානය ඔස්සේ මතු වන නව අවස්ථා ග්‍රහණය කර ගැනීමට DIMO සමූහය මැනවින් සන්නද්ධව සිටියි.

පසුගිය වසර කිහිපය පුරා සමාගම විසින් සැලකිය යුතු ආයෝජනයන් රැසක් සිදු කරන ලදී. මෙම ආයෝජනවල මූලික අරමුණ වූයේ විවිධාංගීකරණය වූ ව්‍යාපාරික ක්ෂේත්‍ර හරහා අවදානම් කළමනාකරණය කරමින් වර්ධනය වේගවත් කිරීමයි. මෙම ආයෝජනවලින් බහුතරයක් මේ වන විට තීරණාත්මක සන්ධිස්ථානයකට පැමිණ ඇති බැවින්, අප බලාපොරොත්තු වූ අරමුණු කෙතරම් දුරට ඉටු වී ඇත්දැයි සමාලෝචනය කර ඒවායේ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව තීරණය කළ යුතුව ඇත. මෙය අපගේ විවිධාංගීකරණ උපායමාර්ගයේ ප්‍රධානතම තීරණයක් වනු ඇත.

බාහිර සාධක හේතුවෙන් සාර්ව ආර්ථිකයට එල්ල වන අහිතකර බලපෑම් මෙන්ම, බදු ගාස්තු සහ රෙගුලාසි හේතුවෙන් වාහන ආනයනයට සිදුවන බලපෑම් ප්‍රවාහන ව්‍යාපාර ක්ෂේත්‍රයට තවදුරටත් අභියෝග එල්ල කළ හැකිය. එමෙන්ම, රටේ ආර්ථිකය ඉතා සැලකිල්ලෙන් කළමනාකරණය කිරීම හරහා අප දැනට ක්‍රියාත්මක වන ව්‍යාපාරික අංශයන්හි නව අවස්ථාවන් ද අප වෙත උදාවනු ඇත. යමෙකුට මෙය සාධනීය මෙන්ම බාධාකාරී තත්ත්වයන් එකලෙස මිශ්‍ර වූවක් ලෙස පෙනී යා හැකි වුවද, අපගේ වත්මන් සැලසුම්වලට අනුව සමූහය සිය වර්ධන වේගය අඛණ්ඩව ඉදිරියටම රැගෙන යමින්, එළඹෙන වසරේ දී මීටත් වඩා විශිෂ්ට ප්‍රතිඵලයක් අත්පත් කර දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙයට විශ්වාසී,



රංජිත් පණ්ඩිතගේ

සභාපති

2026 ජූනි 3, කොළඹ

**Augmented Reality - AR සමඟින් සුවිශේෂී අත්දැකීමක් විඳගන්න – QR කේතය ස්කෑන් කර, මුද්‍රිත වාර්තාව මතින් ඔබේ ස්මාර්ට් ජංගම දුරකථනය රඳවන්න.**

https://www.dimolanka.com/2025-2026-dimo-annual-report/url.php?id=6